# රබර් වගාව ආශ්‍රිත වතු ශ්‍රමිකයින්ගේ ආර්ථිකය
## (පැල්මඩුල්ල ගොඩගම ග්‍රාම නිලධාරී වසම ඇසුරින්)

**ඩී.ඩී.එස්.පී.ඩී.දුනුසිංහ**
**එම්.ජී. කුලරත්න**

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

---

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ වතු ශ්‍රමිකයින් මෙරට වැවිලි ආර්ථිකයේ උන්නතිය සඳහා උපරිම ශ්‍රමදායකත්වයක් සපයන පිරිසකි. එසේ වුවද මොවුන් ග්‍රාමීය සහ නාගරික අංශයන්ට සාපේක්ෂව පහත් ජීවන මට්ටමක ජීවත් වෙති. එලෙස ආර්ථික හා සමාජීය වශයෙන් තවදුරටත් අඩු දියුණු මට්ටමක ජීවත් වන්නේ මන්ද යන්න අධ්‍යයනය කිරීම මෙම අධ්‍යයනයේ ගැටලුව වේ. මෙහිදී ග්‍රාමීය අංශයට සාපේක්ෂව මෙම රබර් වගාව ආශ්‍රිත වතු ශ්‍රමිකයින්ගේ ආදායම, ඉතිරිකිරීම්, පරිභෝජන වියදම් පිළිබඳව ද, ඔවුන්ගේ නිවාසවල තත්ත්වය, සෞඛ්‍යය, අධ්‍යාපනය මෙන්ම දරුවන්ගේ අධ්‍යාපන තත්ත්වය පිළිබඳව ද අවධානය යොමු කෙරුණි.

පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගොඩගම ග්‍රාම නිලධාරි වසම තුළින් ග්‍රාමීය අංශයේ කුටුම්භ 30ක් පාලක නියැදියක් ලෙස ද, එම වසමටම අයත්වන දෙනවක වත්ත තුළ රබර් වගාවේ සේවා නියුක්තව සිටින වතු කම්කරුවන් 30ක් ද අධ්‍යයන නියැදිය වශයෙන් තෝරා ගන්නා ලදී. අධ්‍යයනය සඳහා මූලික වශයෙන් ප්‍රාථමික හා ද්විතියික දත්ත උපයෝගී කරගත් අතර ප්‍රාථමික දත්ත ලබා ගැනීම සඳහා ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා, ක්ෂේත්‍රය පිළිබඳ දැනුම ඇති පුද්ගලයන්ගෙන් තොරතුරු ලබා ගන්නා ලදී. ද්විතියික දත්ත වශයෙන් පර්යේෂණ නිබන්ධන, පොත්පත්, සඟරා, ලිපි, අන්තර්ජාල තොරතුරු මෙන්ම අධ්‍යයන ක්ෂේත්‍රය හා සම්බන්ධ ආයතන මඟින් දත්ත ලබාගන්නා ලදී. ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත ඉදිරිපත් කිරීම සඳහා වගු, ප්‍රස්ථාර භාවිතා කර ඇති අතර දත්ත විශ්ලේෂණය කිරීම සඳහා විස්තරාත්මක සංඛ්‍යානය භාවිතා කර ඇත.

මෙම අධ්‍යයනය මඟින් සොයාගත් තොරතුරුවලට අනුව ග්‍රාමීය අංශයට සාපේක්ෂව මොවුන්ගේ ආදායම, ඉතිරිකිරීම් අධ්‍යාපන මට්ටම ද ඉතාමත් අඩු මට්ටමක පවතී. එලෙසම මොවුන්ගේ දරුවන්ගේ අධ්‍යාපනය දෙස බලනවිට දෙමව්පියන්ගේ අධ්‍යාපන මට්ටමට වඩා ප්‍රගතියක් පෙන්නුම් කළ ද අධ්‍යාපනය සඳහා පිවිසීමට ඇති පහසුකම් ප්‍රමාණවත් නොවන නිසා ග්‍රාමීය අංශයට සාපේක්ෂව එය ඉතාමත් අඩු මට්ටමක පවතී. එලෙසම මෙම දරුවන්ගෙන් බොහෝ පිරිසක් මෙම රබර් වතුවල ම ශ්‍රමිකයින් බවට පත් වී ඇත. මෙම තත්ත්වයන් නිසා තවදුරටත් රබර් වගාව ආශ්‍රිත වතු ශ්‍රමිකයින් අඩු දියුණු මට්ටමක ජීවත් වේ. මෙම තත්ත්වයෙන් මොවුන් මුදවා ගැනීමට නම් ජීවත්වීමට ප්‍රමාණවත් වැටුපක් ලබාදීම, අවශ්‍ය කරන නිවාස පහසුකම් ලබාදීම, විශේෂයෙන් ම මොවුන්ගේ දරුවන්ගේ අධ්‍යාපනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය කරන පහසුකම් ලබාදීම වැනි ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය.

මුඛ්‍ය පදඃ වතු ශ්‍රමිකයින්, ග්‍රාමීය අංශය, රබර් වගාව, ආර්ථිකය

---

[1] surangidd@gmail.com ආර්ථිකවිද්‍යා *කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*
[2] kule_econ@kln.ac.lk ආචාර්ය ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය *කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*